දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011 - 2876169
011 - 2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය
எனது இல.
My No.
PSC/APL/1/පොදු/2018

ඔබේ අංකය
உமது இல.
Your No.
ED/05/67/28/4(I)

දිනය
திகதி
Date
2019.12. 27.

**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය

**<u>අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත්කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධාරීන්ගේ 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබගේ සමාංක හා 2019.12.09 දිනැති ලිපිය හා බැඳේ.

02. 2019 වර්ෂයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ www.psc.gov.lk දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

03. ඒ අනුව මෙතෙක් ක්‍රියාත්මක නොවූ 2019 වාර්ෂික ස්ථාන මාරුවීම් 2020.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලෙසත්, අදාළ නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි.

04. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

05. වාර්ෂික ස්ථාන මාරු නියෝග පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා කිරීමට අපේක්ෂා කරන නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකර ඇති ස්ථාන මාරුවීම් නියෝග හා ඊට අදාළ ආවරණ ලිපිය භාවිතා කර 2002 අංක 4 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව එම අධිකාරය වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි නව සේවා ස්ථාන වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් එම නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

**ආර්.කේ.ආර්.ආර්. රණවීර**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභියාචනා අංශය)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට

## අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත්කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු
## අභියාචනා තීරණ - 2019

| අනු අංකය | නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | ඩී.ජී.එස්. තුෂාරි ගුණරත්න මිය | ලේඛන සහකාර II පන්තිය | මහ/ උසස් බාලිකා විද්‍යාලය | මහ/ බද්උද්දීන් බාලිකා විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 2 | ආර්.එම්. මනුලි සමුද්‍රා කුමාරි මිය | ලේඛන සහකාර | ගා/ කතළුව මධ්‍ය මහා විද්‍යාලය | සමාලෝචන කමිටුව මගින් ස්ථාන මාරුව අවලංගු කර ඇත. | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 3 | සී.වී. වැන්ඩවෝල් මිය | ලේඛන සහකාර II පන්තිය | නු/ පොරමඩුල්ල මධ්‍ය විද්‍යාලය | මහ/ මහාමායා බාලිකා විද්‍යාලය | අභියාචකගේ 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝගය නු/නිල්දණ්ඩාහින්න ජාතික පාසල ලෙස සංශෝධනය කිරීම. |
| 4 | එම්.එච්. මාලිකා සංජීවනී මිය | ලේඛන සහකාර II පන්තිය | බ/ ගුරුතලාව මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය | බ/ වැලිමඩ මධ්‍ය මහා විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 5 | එච්.ඒ. චන්දන කුමාරසිරි මහතා | රසායනාගාර සහකාර | ගම්/ සෙනරත් පරණවිතාන විද්‍යාලය | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 6 | ඒ.ඩබ්.ජී. අනුලාවති මිය | අරක්කැමි III පන්තිය | මහ/ රණසිංහ ප්‍රේමදාස ජාතික පාසල | මහ/ පුෂ්පදාන බාලිකා විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 7 | ආර්.ඩබ්ලිව්.එම්. විජේතිලක රත්නායක මහතා | අරක්කැමි III පන්තිය | ගිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලය | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 8 | එම්.ආර්. ඉෂංකා මදුෂානි මිය | අරක්කැමි III පන්තිය | මහ/ රණසිංහ ප්‍රේමදාස ජාතික පාසල | මහ/ මහාමායා බාලිකා විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 9 | එච්.ඩබ්. ශ්‍රියාලතා මිය | අරක්කැමි I | ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | බිංගිරිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචකගේ 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම. |
| 10 | පී. රාජේන්ද්‍රන් මහතා | ශිලන්හල් සේවක I පන්තිය | ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | කොටගල රජයේ ගුරු විද්‍යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 11 | පී. මලර්මනි මෙය | ශිලන්හල් සේවක | ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | අභියාචකගේ 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම. |